**බළන්ගොඩ නගර සභාව**

**2019-06-11 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව**

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2019.06.11**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රුමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 17. ගරු නාගරික මන්ත්‍රී | අකිල එල්ලාවළ මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

**01. පසුගිය සභාවේ සභා වාර්තාව හා සම්මත කිරීම.**

2019-06-11 වන දින මාසික මහසභාවේ වැඩකටයුතු ආරම්භ කල ගරු සභාපතිතුමන් විසින්, 2019.05.14 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් 2019.05.14 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.
මෙදින සභා වාර්තාව සඳහා සංශෝධන තිබේදැයි ගරු සභාපතිතුමන් විසින් විමසා සිටි අවස්ථාවේ අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් සංශෝධනයන් ලෙස,

**12 පිටුවේ 5ඃ01ඃ12 යටතේ**
විදුලිය සඳහා ලබාදුන් ගොඩනැගිල්ලක් ලෙසත්

**18 පිටුවේ**
ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්වල සඳහන් වූයේ 2003 වර්ෂයේ අයවැයෙන් මුදල් වෙන්කර බෙල්ජියම රටේ ආධාර අනුව ජල ව්‍යාපෘතිය සිදු කළ බවයි.නමුත් එය 2013 වර්ෂය ලෙස නිවැරදි විය යුතු බව සඳහන් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධන ලෙස **11 පිටුවේ 05ඃ01ඃ11 යටතේ** තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු නිළධාරි ලෙස සභාවේ ලේකම් සහ නම්කල නිළධාරියා ලෙස ගරු සභාපතිතුමා පත් කිරීමේ යෝජනාව යටතේ තොරතුරු නිළධාරි ලෙස මහජන නියෝජිතයෙක් බැවින් සභාපතිතුමා පත් නොකරන ලෙස යෝජනා කල අතර එම යෝජනාව එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කළ බවත්, නමුත් එය වාර්තාගතව නොමැති බව සඳහන් කරන ලදී.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- වෙසක් පොහොය නිමිති කරගෙන නගරය විදුලි බුබුළු වලින් ආලෝකමත් කර අලංකාරවත් කිරීමට සහයෝගය ලබා දුන් සිදුසංක මහතා ඇතුලු තරුණ කැළටත්, පාසල් ආදි ශිෂ්‍ය සංගම් එකමුතුවටත් (FOBASA), වෙළෙඳ සංගමය ප්‍රමුඛ වෙළෙඳ ප්‍රජාවටත්, බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා,මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුලු සමස්ථ කාර්ය මණ්ඩලයේ ස්තුතිය පළ කර සිටින ලදී.

- පොසොන් පොහොය නිමිති කර ගෙන බළන්ගොඩ නගර සභාවේ සියලුම කාර්ය මණ්ඩලය සහභාගීත්වයෙන් 2019.06.14 වන දින දවස පුරා ශීල ව්‍යාපාර වැඩසටහනක් නගර සභා පරිශ්‍රයේදී පැවැත්වෙන බැවින් එම අවස්ථාවට සියලුම මන්ත්‍රී මණ්ඩලයේ පැමිණීම අපේක්ෂා කරන බව පවසා සිටියේය.

- බළන්ගොඩ නගර සභාව හා බළන්ගොඩ තරුණ කැළ එක්ව පොසොන් පොහොය දින පොසොන් බැති ගී ප්‍රසංගයක් ඊ.ජ්.එල් පරිශ්‍රයේදී පැවැත්වීමට සුදානම් කර ඇති බැවින් ඒ සඳහා මන්ත්‍රී මණ්ඩලයේ අනිවාර්ය පැමිණීම හා සහයෝගය ඉල්ලා සිටින ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

**03:01 රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2019 සභාවට ඉදිරිපත් කිරීම.**

සියලුම රාජ්‍ය ආයතන පරිශ්‍රය තුළ හා රාජ්‍ය ආයතන වලට අයත් ආපන ශාලා වල බුලත් විට, දුම්කොළ, පුවක් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන භාවිතය මෙන්ම අලෙවිය තහනම් බව සභාපතිතුමා විසින් පවසා සිටින ලදී.

**03:02 හුණු කුඹුර, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි කුන්ජි මොහොමඩ් නසාර් මහතා විසින් ඉදිරිපත් කර ඇති කුකුල් ගොවිපළක් සම්බන්ධ පැමිණිල්ල සභාවට ඉදිරිපත් කිරීම.**

කේ.එම්.නසාර් යන අය විසින් පවත්වා ගෙන යන කුකුල් ගොවිපළ හේතුවෙන් අවට නිවාස වල සිටින ජනතාව මහත් අපහසුතාවයකට පත්ව ඇති බවට එම ලිපියෙහි සඳහන් වී ඇති බැවින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාට මේ පිළිබඳ සොයා බලා වාර්තා කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දන්වා සිටියේය.

**03:03 වට රවුම නඩත්තු කර පවත්වාගෙන යාමට වෙළෙඳ සංගමය මඟින් කළ ඉල්ලීම.**

වට රවුම නඩත්තු කර පවත්වාගෙන යාමට වෙළෙඳ සංගමය ඉල්ලීමක් කර ඇති අතර මේ වන විට කැන්රිච් ආයතනය සමඟ ගිවිසුම්ගතව ඇති බැවින් ඉදිරියේදී වෙළෙඳ සංගමය වෙත මෙම අවස්ථාව ලබා දෙන බව සභාපතිතුමා විසින් පවසන ලදී.

**04. කල් දී ඇති යෝජනා**

*04:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා*

**04:01:01 වැලිහරනාව මාර්ගයේ දෙපස කාණු පද්ධතිය අළුත් වැඩියා කිරීම සඳහා සමිතියක් තෝරා ගැනීම.**

වැලිහරනාව මාර්ගයේ දෙපස කාණු පද්ධතිය අළුත් වැඩියා කිරීම සඳහා සමිතියක් තෝරා ගැනීමේ යෝජනාව සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. මෙහිදී මෙම කර්මාන්තය පළාත් සභා අරමුදලින් සිදු කරන බව පවසා සිටි ගරු සභාපතිතුමන් මෙම කර්මාන්තය ඉටු

කිරීමට කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතියට ලබා දීම සුදුසු බව යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි එම්. සුනේත්‍රා. ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**04:01:02 මාසික දීමනා ක්‍රමය යටතේ පෙර පාසල් පාලිකාවක් බඳවා ගැනීම.**

මාසික දීමනා ක්‍රමය යටතේ පෙර පාසල් පාලිකාවක් බඳවා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.
මෙහිදි අදහස් දක්වූ ගරු සභාපතිතුමන්, මේ වන විට නගර සභාව වෙත පෙර පාසල් පාලිකාවන්ගේ අයදුම්පත් අටක් (08) පමණ ලැබී ඇති අතර එම අයදුම්පත් අතරින් එම්.ඩබ්.චන්දිමා නිලන්ති හා කේ. කේ. ශ්‍යාමා සිරිනි ශාන්ති යන අයදුම්කරුවන් දෙදෙනා පමණක් බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් ලබා ඇති බව සඳහන් කරන ලදී.

මේ අතරින් වැඩිම සුදුසකම් ලත් කේ.කේ.ශ්‍යාමා සිරිනි ශාන්ති මහත්මිය බඳවා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කල අතර, ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**04:01:03 කසළ ට්‍රැක්ටරය ගමන් කල නොහැකි මාර්ගයන්හි කසළ එකතු කිරීම සඳහා වාහනයක් මිළදී ගැනීම.**

කසළ ට්‍රැක්ටරය ගමන් කල නොහැකි මාර්ගයන්හි කසළ එකතු කිරීම සඳහා වාහනයක් මිලදී ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර, ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.
මෙහිදි අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් පවසා සිටියේ පුවත්පත් දැන්වීමක් පළ කර, මිළ ගණන් කැඳවා සුදුසු වාහනයක් මිළදී ගැනීමත්, ගරු ආණ්ඩුකාරතුමාගෙන් ද මේ සඳහා සුදුසු වාහනයක් ඉල්ලා ලිපියක් යැවීමත් සුදුසු බවයි.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

මෙවර බළන්ගොඩ නගරයේ පැවැත්වෙන මිහිඳු පෙරහැර ගැන දැනුවත් කිරීම සඳහා පෙරහැර කමිටුවේ නිළධාරියෙකු පැමිණ සිටියේය. මෙහිදී ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන්

සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරන ලද අතර, එම දැනුවත් කිරීමෙන් පසුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු උප සභාපතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**04ඃ01ඃ04 නගර සභාව සඳහා නව රියදුරෙකු බඳවා ගැනීම - ටී. එම්. ජී. පී. විමලසිරි මයා**

නගර සභාව සඳහා නව රියදුරෙකු වශයෙන් ටී.එම්.ජී.පී.විමලසිරි මයා බඳවා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර, ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**04ඃ01ඃ05 කර්මාන්ත අවශ්‍යතා සඳහා තාර බැරල් 100 ක් හා කෝලාස්ට් බැරල් 10 ක් මිලදී ගැනීම සඳහා කැඳවන ලද මිල ගණන් ඉදිරිපත් කිරීම.**

<u>තාර</u>

| | |
|---|---|
| බිටුලින්ක් ඉමල්ෂන් | කි.ග්.180 බැරලය රු.15,450.00(ප්‍රවාහනය සහිතව) |
| ජී.කේ.යූ.සී.ඉන්ටර්නැෂනල් | කි.ග්.180 බැරලය රු.15,480.00(ප්‍රවාහනය සහිතව) |
| බිටුමික්ස් පුද්.සමාගම | කි.ග්.180 බැරලය රු.15,430.00(ප්‍රවාහනය සහිතව) |
| ඛනිජ තෙල් නීතිගත සංස්ථා | කි.ග්.180 බැරලය රු.15,480.00 (ප්‍රවාහනය රහිතව) |

<u>කෝලාස්ට්</u>

| | |
|---|---|
| බිටුලින්ක් ඉමල්ෂන් | ලීටර් 200 බැරලය රු.13,550.00 |
| ජී.කේ.යූ.සී.ඉන්ටර්නැෂනල් | ලීටර් 200 බැරලය රු.13,680.00 |
| බිටුමික්ස් පුද්.සමාගම | ලීටර් 200 බැරලය රු.13,500.00 |
| ඛනිජ තෙල් නීතිගත සංස්ථා | මිල ගණන් නැත. |

කර්මාන්ත අවශ්‍යතා සඳහා තාර බැරල් 100 ක් හා කෝලාස්ට් බැරල් 10 ක් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිල ගණන් ඉදිරිපත් කිරිමේ යෝජනාව සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති බිටුමික්ස් පුද්.සමාගම මඟින් තාර හා කෝලාස්ට් මිළදී ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රිනි එම්. සුනේත්‍රා. ඩී. වීරසිංහ මැතිතුමිය විසින් එය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

වෘත්තිය පුහුණු අධිකාරිය මගින් සිදු කරන පුහුණු පාඨමාලා ගැන දැනුවත් කිරීම සඳහා නිළධාරියෙකු පැමිණ සිටි බැවින් මෙහිදී ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මන්ත්‍රීතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරන ලද අතර, එම දැනුවත් කිරීමෙන් පසුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු උප සභාපතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**04:01:06 මහජන සෞඛ්‍ය පිළිබඳ අතුරු ව්‍යවස්ථා 16 ඉදිරිපත් කිරීම.**

සබරගමුව පළාත් ආණ්ඩුකාරතුමා විසින් මහජන සෞඛ්‍ය පිළිබඳ අතුරු ව්‍යවස්ථා දහසයක් යොමු කර ඇත. එනම්,

1. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
2. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ ආහාර පිණිස සතුන් ඝාතනය කිරීම හා ඝාතනය සඳහා රඳවා තබා ගන්නා ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
3. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ ආහාර සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
4. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ උත්සව ශාලා පවත්වා ගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
5. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය එළවලු හෝ පළතුරු විකුණන ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
6. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ ගල් වළවල් හා ගල් ඇඹරුම්හල් පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
7. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ තේ කෝපි කඩ හා කෙටි ආහාර විකිණීමේ ස්ථාන පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
8. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ නොමිලේ ආහාර බෙදා හැරීම සම්බන්ධයෙන් මහජන පීඩා වැළැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
9. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පෞද්ගලික ළිං පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
10. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීමේ ස්ථාන පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
11. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීමේ ස්ථාන පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
12. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
13. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ ලැගුම්හල් හා නැවතුම්පලවල් පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
14. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළෙඳාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

15. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ සිල්ලර වෙළෙඳසැල් පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

16. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ හෝටල් පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

ඉහත සඳහන් අතුරු ව්‍යවස්ථා දහසයෙහි ප්‍රාදේශීය සභා වෙනුවට නගර සභාව යනුවෙන් ආදේශ කර, එමෙන්ම එහි සඳහන් ප්‍රාදේශිය සභා පනතට අදාල වගන්ති නගර සභා ආඥා පනතෙහි වගන්ති වගට අදාළ වන ලෙස ගැලපීමෙන් අනතුරුව එකී අතුරු ව්‍යවස්ථා සඳහා එකඟතාවය පල කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**04:01:07 පුස්තකාල එළිමහන් අධ්‍යයන අංශය ස්ථාපිත කිරීම සඳහා සමිතියක් තෝරා ගැනීම.**

පුස්තකාල එළිමහන් අධ්‍යයන අංශය ස්ථාපිත කිරීම සඳහා සමිතියක් තෝරා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනි එම්. සුනේත්‍රා. ඩී. වීරසිංහ මැතිතුමිය විසින් එය ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මෙම කර්මාන්තය ලබා දීම සඳහා එකමුතු ජ්‍යෙෂ්ඨ පුරවැසි සංගමය සුදුසු බවට කරන ලද යෝජනාව ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**04:01:08 බළන්ගොඩ මිහිඳු මහ පෙරහැර සඳහා රු.25,000.00 ක මුදලක් ලබා දීම.**

බළන්ගොඩ මිහිඳු මහ පෙරහැර සඳහා රු.25,000.00 ක මුදලක් ලබා දීමේ යෝජනාව යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රි නදීශාන් ප්‍රදීප් වික්‍රමාරච්චි මැතිතුමා විසින් එය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

**05:01 වැලිහරනාව මාර්ගයේ දෙපස කාණු පද්ධතිය අළුත් වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල රු. 950,000.000**

වැලිහරනාව මාර්ගයේ දෙපස කාණු පද්ධතිය අළුත් වැඩියා කිරීමේ රු. 950,000.000 ක ඇස්තමේන්තුව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර, ගරු නාගරික මන්ත්‍රි එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 06. මන්ත්‍රි යෝජනා

### 06:01 ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා

**06:01 ඉඹුල්පේ ප්‍රාදේශිය බල ප්‍රදේශයේ සිට අයාලයේ නගරයට එන හරක් බැඳීමට අවශ්‍ය කටයුතු කිරීම**

ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ **ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන්** පවසා සිටියේ ඉඹුල්පේ ප්‍රදේශීය බල ප්‍රදේශයේ අලුත්නුවර සිට පැමිණෙන ගවයින් බළන්ගොඩ නගරය වෙත විශාල වශයෙන් පැමිණෙන බවයි. එම නිසා ගව අයිතිකරුවන් සොයා ඔවුන්ට ගවයින් භාර දීම හෝ අයිතිකරුවන් නොමැති ගවයින්, ගවයින් රැක බලා ගන්නා වෙනත් කෙනෙකුට හෝ පැවරීම කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී. එමෙන්ම ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා වැඩි දුරටත් අදහස් දක්වමින් පවසා සිටියේ අයාලේ යන ගවයින් සම්බන්ධව කටයුතු කිරීම නගර සභා ආඥා පනත මඟින් නගර සභාවට පැවරී ඇති කාර්යයක් බවයි.

මේ සම්බන්ධව **ගරු නාගරික මන්ත්‍රි අකිල එල්ලාවල මැතිතුමා අදහස් දක්වමින්**, ඉඹුල්පේ ප්‍රාදේශිය සභාවේ ගරු සභාපතිතුමන් විසින් මේ සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් තණමල්විල ප්‍රාදේශිය සභාව හා තණමල්විල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය එක්ව මෙම ගවයින් තණමල්විල ප්‍රදේශයට රැගෙන ගිය බවත්, නමුත් ගම්වාසීන්ගේ දැඩි විරෝධතාවයක් පැමිණි නිසා මේ වන විට එය නතර කර ඇති බවත් පවසා සිටියේය.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව සතුව ඉඩම් පවතින අතර භාගල කන්ද නැමති ඉඩමේ අක්කර දෙක, තුනක් යොදා ගෙන මෙම ගවයින් ගාල් කර තැබිය හැකි බවත්, ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව හා ඉඹුල්පේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සමඟ සාකච්ඡාවක් කැඳවා මේ සඳහා පියවරක් ගැනීම සුදුසු බව පවසා සිටියේය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:02 **ගරු නාගරික මන්ත්‍රිනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

**06:02:01** හුණු කුඹුර කෝපිවත්ත,මාර්ගයේ බී.සෝමසිරි මහතාගේ නිවස ඉදිරිපස අඩි 12ක් පමණ දිග කාණුව කැඩී ඇති බැවින් හා ජලය රැඳී පවතින බැවින් එය ප්‍රතිසංස්කරණය කිරීම.

**06:02:02** ආනන්ද මෛත්‍රී මාවත මාර්ගය නගර සභා සීමාව දක්වා කාණුව හා දෙපස මාර්ගය ශුද්ධ පවිත්‍ර කිරීම.

ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි කේ. ජී. පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් අදහස් දක්වමින්,** හුණු කුඹුර කෝපිවත්ත මාර්ගයේ බී. සෝමසිරි මහතාගේ නිවස ඉදිරිපස කාණුව මේ වන විට කොන්ක්‍රීට් කර ඇති අතර අඩි 12ක් පමණ දිග කොටසක් පමණක් කොන්ක්‍රීට් කිරීමට ඉතිරිව ඇති බව පවසන ලදී. කොන්ක්‍රීට් කර නොමැති කොටස කොන්ක්‍රිට් කිරීමට නොහැකි වූයේ කාණුව මැද කළු ගලක් තිබීම නිසා බවත්, මේ වන විට එම කළු ගල කඩා පෞද්ගලික නිවසකට යන පාරක් සාදා ඇති බැවින් කාණුව කොන්ක්‍රිට් කිරීමේ හැකියාව පවතින බවත් වැඩිදුරටත් පවසන ලදී.

එමෙන්ම ජුනි මස 14 වෙනි දින උඩුමුල්ල විහාරස්ථානයේ පිංකමක් පවතින බැවින්, ආනන්ද මෛත්‍රී මාවත මාර්ගය නගර සභා සීමාව දක්වා කාණුව හා දෙපස මාර්ගය ශුද්ධ පවිත්‍ර කරදෙන මෙන් ඉල්ලා සිටියාය.

මෙහිදී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමන් විසින්, 06:02:01 යෝජනාව නඩත්තු ලේඛනයට ඇතුළත් කර ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරන කිරීමටත්, 06:02:02 යෝජනාව අනුව මෙම මාර්ගය පළාත් මාර්ගයක් බැවින් ඉදිරියේදී සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කරන බව පවසා සිටියේය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:03** **ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

**6:3:1** ධීවර සංස්ථාවේ මාළු විකිණීම සඳහා කඩ කාමරයක් ලබා දීම.

**6:3:2** ඌරු මස් වෙළෙඳාම සඳහා කඩ කාමරයක් ලබා දීම.

ගරු නාගරික මන්ත්‍රිනි එම්. සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රිනි එම්. ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ **ගරු නාගරික මන්ත්‍රිනි එම්.සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය** විසින් පවසා සිටියේ වෙනත් ප්‍රදේශවල ඌරු මස් කඩ තිබෙන නමුත් බළන්ගොඩ ප්‍රදේශයේ ඌරු මස් කඩයක් දැමීමට නොහැකි ද යන්න කිහිප දෙනෙක් තමන්ගෙන් විමසූ බවය. එමෙන්ම බොහෝ මාළු වෙළෙඳුන් අධික මුදලක් ලබා ගනිමින් මාළු වෙළඳාම සිදු කරන බැවින් ධීවර සංස්ථාව සඳහා කඩයක් ලබාදිය හැකිද යන්න පිළිබඳවත් උපදෙස් බලාපොරොත්තු වන බව පවසා සිටියාය.

මෙහිදී ගරු සභාපතිතුමන් අදහස් දක්වමින්, ධීවර සංස්ථාව ඉල්ලා සිටියේ පූජ්‍යදාස මහතාගේ නිවස පිටුපස කඩය වන අතර, එම කඩය තමා ලබා දීමට අකමැති වූයේ එයින් සභාවට ආදායමක් නොලැබෙන බැවින් බව ද එම නිසා ධීවර සංස්ථාව සඳහා පොදු වෙළෙඳසැලෙන් කඩයක් ලබා දිය හැකි බව ද පවසා සිටියේය.

**ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා අදහස් දක්වමින්,** පොදු වෙළෙඳසැලෙන් පිටත වෙනත් ස්ථානයක ලබා දීම තුළින් වෙනත් කවුරුන් හෝ මාළු වෙළෙඳාම සඳහා පොදු වෙළෙඳසැලෙන් පිටත ස්ථානයක් ඉල්ලුවහොත් ලබා දීමට සිදුවන බැවින් ධීවර සංස්ථාව සඳහා පොදු වෙළෙඳසැලෙහි කඩයක් ලබාදීම සම්බන්ධව ගැටලුවක් නොමැති බවත්, ධීවර සංස්ථාවේ මාළු ලාභ වුවද ඔවුන් ලබා දෙන්නේ ශීත කල මාළු බවත් පවසා සිටියේය.

එමෙන්ම ඌරු මස් කඩය පිළිබඳ අදහස් දක්වමින්, රට තුල මුස්ලිම් අන්තවාදය ඇතිවී තිබෙන අවස්ථාවක් බැවින් හා මුස්ලිම් ජනතාව ඌරු මස් පිළිබඳ දැඩි අකමැත්තක් පවතින බැවින් මෙම අවස්ථාවේදී බළන්ගොඩ නගරයේ ඌරු මස් කඩයක් ආරම්භ කිරීමෙන් මුස්ලිම් ජනතාවට පහර ගැසීමක් සිදුවන බවත්, මෙම තත්ත්වය සමථයකට පත් වූ පසු ඌරු මස් කඩයක් දැමීම සුදුසු බවත් පවසා සිටියේය.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින්,** සම්මත අතුරු ව්‍යවස්ථාව අනුව පොදු වෙළෙඳසැලෙහි ස්ථානයක හෝ නගර සභාවෙන් බලය ලබා දෙන ස්ථානයක හැර මස් මාළු වෙළෙඳාම් කිරීම තහනම් බව පැවසීය. එමෙන්ම ඌරු මස් කඩයක් දැමීමෙන් මුස්ලිම් ජනතාවට අසාධාරණයක් වන බව පැවසුව ද, ලංකාවේ බහුතරය සිංහල ජනතාව වන අතර සිංහල ජනතාව හරක් මස් නොකන බැවින් හා ඌරු මස් කන බැවින් එය සිංහල ජනතාවගේ අයිතියක් බව පැවසීය.

තමාගේ පාලන කාලයේදී ධීවර සංස්ථාව සඳහා අවසර ලබා නොදුන්නේ නගර සභාවෙන් අවසර නොගෙන කඩයක් දැමීමට සූදානම් වූ බැවින් සභාපතිවරයාට තිබෙන බලතල අනුව තමා එය තහනම් කළ බව පැවසීය. එමෙන්ම ධීවර සංස්ථාවේ මාළු අඩු මිලකට ජනතාවට මිලදී ගත හැකි නම් හා මහජනතාව විසින් ධීවර සංස්ථාව ඉල්ලා සිටින්නේ නම් අපි මහජනතාවගේ ඉල්ලීම ඉටුකළ යුතු බව වැඩිදුරටත් පවසන ලදී.

මෙම යෝජනා දෙක පිළිබඳ ඡන්ද විමසීමක් අවශ්‍ය වේ නම් ඡන්ද ක්‍රමයකට වුවද යා හැකි බව පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා ඌරු මස් කඩය හා ධීවර සංස්ථාව සඳහා කඩයක් අනිවාර්යයෙන් ලබා දෙන ලෙසත් ප්‍රකාශ කළේය.

**ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා,** මේ සම්බන්ධව නැවත වරක් අදහස් දක්වමින් පවසා සිටියේ චුන්දකර්මාර පුත්‍ර ලබා දුන් ඌරු මස් ආහාරයට ගැනීමෙන් හෝ හතු විශේෂයක් ආහාරයට ගැනීමෙන් බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන් පෑ බවට මත දෙකක් පවතින අතර එහි අර්ථය තමා නිවැරදිව නොදන්නා බව ප්‍රකාශ කර සිටියේය.

හරක් මස් කඩ හා කුකුල් මස් කඩ වසා දමන්නේ නම්, එවන් අවස්ථාවක ඌරු මස් කඩයක් දැමීමට අවසර දීමෙන් සිදුවන්නේ තව සතෙක් මැරීමට අනුබල ලබා දීමක් බවත්, ප්‍රාණඝාතය සතෙකුගේ වුව ද මනුෂ්‍යයෙකුගේ වුව ද සැමටම සමාන බවත්, පැවසූ ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා මේ සඳහා තමන්ගේ විරෝධතාවය දක්වන බව ප්‍රකාශ කර සිටියේය.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින්,** බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවේ ඌරු මස් ආහාරයට ගැනීමෙන් නොවන අතර, එසේ ප්‍රකාශ කරන්නේ අබ්දුල් රාසික් බවත්, බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවේ ඌරන් ලැගපු ස්ථානයක හටගත් හතු විශේෂයක් වැළඳීමෙන් සෑදුනු ලෝහිත පක්ඛන්ධිකා නැමති රෝගය හේතුවෙන් බවත් ප්‍රකාශ කර සිටියේය.

මෙහිදි **ගරු සභාපතිතුමන් අදහස් දක්වමින්** පවසා සිටියේ නගර සභා ආඥා පනත අනුව මන්ත්‍රීවරයෙකු ගෙන ආ යම් යෝජනාවක් පිළිබඳ අදහස් දැක්වීමේ දී එක් මන්ත්‍රීවරයෙකු එක් වරක් අදහස් ප්‍රකාශ කිරීමෙන් පසු නැවත වරක් අදහස් ප්‍රකාශ කළ නොහැකි බැවින් එසේ කිරීමෙන් සභාවේ යහගුණයට, පිළිවෙලට හා ක්‍රමාණුකුලභාවයට හානි සිදුවන බව පැවසීය. එමෙන්ම වෙනත් මන්ත්‍රීවරයෙකු ඉදිරිපත් කරන අදහස්වලට අදාලව තවත් මන්ත්‍රීවරයෙකුට කිසිදු අදහසක් ප්‍රකාශ කර නොහැකි අතර එසේ කිරීමෙන් සිදුවන්නේ කාලය නිකරුණේ නාස්තිවීමක් බවයි. එනිසා මන්ත්‍රීවරු සියලුදෙනා ආඥා පනත් නීතිරීති කියවා ඒ පිළිබඳ දැනුවත් වී සභාවට සම්බන්ධ වන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා අදහස් දක්වමින්,** මිනිසුන් මස් හා මාළු කඩ පවතින බැවින් පොදු වෙළෙඳසැලට පැමිණෙන අතර ධීවර සංස්ථාව සඳහා කඩයක් පොදු වෙළෙඳසැලෙන් පිටත වෙනත් ස්ථානයක ලබා දුනහොත් මේ වන විට පැමිණෙන තරම් පිරිසක්වක් නොපැමිණිය හැකි බව පැවසීය. එබැවින් පොදු වෙළෙඳසැලෙහි කඩයක් ලබා දෙන්නේ නම් වඩාත් සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම, ඌරු මස් වෙළෙඳාම සඳහා කඩයක් ලබා දීම පිළිබඳව අදහස් දක්වමින් ගරු මන්ත්‍රීතුමා පවසා සිටියේ 2002 වර්ෂයේදී විමලසේන වැවේගෙදර මැතිතුමා සභාපති වශයෙන් සිටින කාලයේ දී ද, නැවත වරක් ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා සභාපති වශයෙන් සිටින කාලයේදීද, මෙම යෝජනාව පැමිණි බවයි. නමුත් මුස්ලිම් ජනතාවට කරන ගෞරවයක් සේ සළකා ඒ සඳහා ඉඩ ලබා නොදුන් අතර ඒ පිළිබඳව හිටපු සභාපතිතුමාට ස්තුතිවන්ත වන බව පවසා සිටියේය.

නමුත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා මේ අවස්ථාවේදී උෟරු මස් වෙළෙඳාම සඳහා කඩයක් ලබා දිය යුතු බව ප්‍රකාශ කර සිටියද, එතුමාගේ පාලන සමයේ මේ සඳහා විරුද්ධ වූයේ එතුමාගේ පාලන සමයේ සම්මත වූවායැයි මිනිසුන් අතර ආන්දෝලනයක් ඇතිවන බැවින් බව වැඩිදුරටත් පවසන ලදී.

එමෙන්ම මුස්ලිම් ජනතාව එක්සත් ජාතික පක්ෂයට ලැදියාවක් දක්වන බැවින් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරියක් මෙම යෝජනාව රැගෙන ඒම පිළිබඳව තමන් මෙන්ම මුස්ලිම් ජනතාවද කණගාටු වන බව පැවසීය. එබැවින් මෙය නතර කරන ලෙස සභාපතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමින් තමා මෙම යෝජනාව පිළිබඳව තදින්ම විරුද්ධවන බව පවසා ගරු නාගරික මන්ත්‍රි එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා අදහස් දැක්වීම අවසන් කළේය.

**ගරු නාගරික මන්ත්‍රි වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා** අදහස් දක්වමින් පවසා සිටියේ රටේ ඇතිවී තිබෙන තත්ත්වය සලකා සුනේත්‍රා මන්ත්‍රීතුමිය උෟරු මස් වෙළෙඳාම සඳහා කඩයක් ලබා දීම පිළිබඳ යෝජනාව රැගෙන ආ බවට තමා විශ්වාස නොකරන බවයි. වැරදි ක්‍රමයට හරක් මැරීම නිසා හරක් මස් කඩ පිළිබඳ තමා දැඩි අරගලයක් කළ බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා තමා හරක් මස් කඩ ටෙන්ඩරයට අත්සන් නොකරන බව ද, එය තමන්ගේ ප්‍රතිපත්තිමය තීරණයක් බව ද ප්‍රකාශ කර සිටියේය.

බේරුවල ආදි වෙනත් ප්‍රදේශවල පවා උෟරු මස් කඩ පවතින අතර උෟරු මස් කඩය පිළිබඳ යෝජනාව සභාපතිතුමා න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම වැරදි නොවන බව ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ජාතිවාදය නොතිබූ මීට පෙර දිනක දී උෟරු මස් කඩය පිළිබඳ යෝජනාව තමන් රැගෙන ආ නමුත් සියලු දෙනා ඊට අකමැති වූ බව පැවසූ අතර, එම අවස්ථාවේදී තමන් මෙම යෝජනාව රැගෙන ආවේ ජාතිවාදය ගැන නොසිතා බව වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේය.

මීට පෙර අවස්ථාවේ දී හිටපු සභාපතිවරයා මෙම යෝජනාවට අකමැති වුව ද, පසුව හෝ ඔහුට මෙහි අවශ්‍යතාවය තේරුම් යාම පිළිබඳව තමා සතුටු වන බවත්, උෟරු මස් වෙළෙඳාම සඳහා කඩයක් ලබා දීම පිළිබඳ තමා විරුද්ධ නොවන බවත් ප්‍රකාශ කළේය.

ධීවර සංස්ථාව සඳහා කඩයක් ලබා දීම පිළිබඳ අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රි වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා සතොස ගොඩනැගිල්ල පිටුපස කොටසේ ගොඩනැගිල්ල මේ සඳහා සුදුසු බවත්, පොදු වෙළෙඳසැලෙන් පිටත වෙනත් ස්ථානයක මස් මාළු වෙළෙඳාම් කරන්නේ නම් ඒ සඳහා අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ගත යුතු බවත් පැවසීය. එමෙන්ම නීති සකස් කරන ස්ථානය නගර සභාව බැවින් අවශ්‍ය නිතී සකස් කර එම ස්ථානය ලබා දීම හෝ පොදු වෙළෙඳසැලෙහි කඩයක් ලබා දීම

සම්බන්ධයෙන් ගැටලුවක් නොමැති බව ප්‍රකාශ කරමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කළේය.

**ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා** අදහස් දක්වමින් පැවසූයේ අපි ගමක්, රටක්, ජාතියක් වශයෙන් සංවර්ධනය වන විට සමහර අවස්ථාවලදී අපි විසින් පෞද්ගලිකව ප්‍රතික්ෂේප කරන ඇතැම් දේ සිදු කිරීමට සිදුවන බවයි. ඌරු මස් හෝ හරක් මස් ආහාරයට ගැනීම ප්‍රජාතන්ත්‍රවාදී මානව අයිතිවාසිකමක් වුව ද කැලේ සිටින සතෙක් මරා හෝ වල් ඌරු මස් ආහාරයට ගැනීම නිතී විරෝධී වන අතර, එසේ මරා ඇති ඌරු මස් ආහාරයට ගැනීම ශරීර සෞඛ්‍යයට අහිතකර බව පැවසීය. එමෙන්ම තමාගේ පෞද්ගලිකත්වය නිසා මුළු මහත් සමාජයකට අසාධාරණයක් කළ නොහැකි බැවින් නීත්‍යානුකූල හරක් මස් කඩයක් හෝ ඌරු  මස් කඩයක් අදාල නීති රාමුව යටතේ පවත්වාගෙන යාම ප්‍රශ්නයක් නොවන බව ප්‍රකාශ කර සිටියේය.

එසේම ධීවර සංස්ථාව මඟින් මාළු කඩයක් ආරම්භ කිරීමෙන් වෙළෙඳපල තුළ තරඟකාරීත්වයක් ඇති වී ලාභදායි මිළට මාළු ලබා ගැනීමට හැකිවීම තුළින් පාරිභෝගිකයාට යහපත් ප්‍රතිලාභ හිමි වන නිසාවෙන් ධීවර සංස්ථාව මඟින් මාළු කඩයක් ආරම්භ කිරීම ගැටලුවක් නොවන බව පැවසීය.

මෙහි දී අපි කවුරුත් හැඟීම්බර නොවී කටයුතු කළ යුතු අතර රටක් ජාතියක්, සමාජයක් දියුණු කිරීමට නම් සමහර අවස්ථාවලදී අපගේ ප්‍රතිපත්ති පසෙකලා තීන්දු තීරණ ගැනීමට සිදුවන බව ප්‍රකාශ කරමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කළේය.

**ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා අදහස් දක්වමින්,** මෙම යෝජනාව රැගෙන ඒම පිළිබඳව විරුද්ධ නොවන බවත්, වෙනත් අයගේ අදහස් අනුව සභාවට යෝජනා ඉදිරිපත් නොකරන ලෙසත්, සුනේත්‍රා මන්ත්‍රීතුමියගෙන් ඉල්ලා සිටි අතර, බළන්ගොඩ නගර සභා සීමාව තුළ ජීවත් වන ජනතාවගේ අවශ්‍යතා ඉටුකිරීම සභාපතිතුමාගේ වගකීමක් බැවින් එයට සහයෝගය ලබා දීම මන්ත්‍රීවරුන්ගේ වගකීමක් වන බව ද පැවසීය. හරක් මස් මුස්ලිම් ජනතාවගේ ජාතික ආහාරය නොවන අතර සිංහල කතෝලික  ජනතාව ද හරක් මස් ආහාරයට ගන්නා බව පැවසූ ගරු උපසභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා ඌරු මස් කඩයක් දැමීම ගැටලුවක් නොවන බව වැඩිදුරටත් පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු උපසභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ 2002 වර්ෂයේ විමලසේන වැවේගෙදර සභාපතිතුමාගේ කාලයේ ද, අනතුරුව ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ සභාපතිතුමාගේ කාලයේදී ද, ඌරු මස් කඩය පිළිබඳ යෝජනාව පැමිණි නමුත් එම අවස්ථා දෙකෙහිදීම එම යෝජනාව ප්‍රතික්ෂේප වූ බවයි.

එමෙන්ම හරක් මස් කඩය වසා දමන්නේ නම් එයට තමන් සතුටු වන අතර, හරක් මස් කඩ වෙනුවෙන් කථාකරන්නේ බළන්ගොඩ  හරක් මස් ව්‍යාපාරිකයන් වෙනුවෙන් බව පැවසීය.

මෙහිදී මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීමෙන් අනතුරුව ධීවර සංස්ථාව සඳහා කඩ කාමරයක් ලබා දීම පිළිබඳ යෝජනාව හා ඌරු මස් වෙළෙඳාම සඳහා කඩ කාමරයක් ලබා දීම පිළිබඳ යෝජනාව සම්මත කර ගැනීම සඳහා ඡන්දයක් පැවැත්වීමටත්, ඒ සඳහා පක්ෂව හා විපක්ෂව ඡන්දය ලබා දෙන ලෙසත් ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දෙන ලදී. සභාවේ කැමැත්ත පරිදි විවෘත ඡන්දයක් පැවැත්වීම සුදුසු බව සභාපතිතුමාගේ තීරණය විය. මෙහිදී පළමුව යෝජනා අංක 06:03:01 ධීවර සංස්ථාවේ මාළු විකිණීම සඳහා කඩ කාමරයක් ලබා දීම පිළිබඳ යෝජනාවට ඡන්දය විමසූ අතර එහිදී යෝජනාවට පක්ෂව සභිකයන් දාහතරදෙනෙක්ද, එනම්,

1. ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා
3. ගරු නාගරික මන්ති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය
9. ගරු නාගරික මන්ත්‍රී එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා
10. ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා
11. ගරු නාගරික මන්ත්‍රිනි එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය
12. ගරු නාගරික මන්ත්‍රිනි එම්. ශාන්තිලේඛා මැතිතුමිය
13. ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා
14. ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවළ මැතිතුමා

මෙහිදී යෝජනාවට විරුද්ධව සභිකයන් තුන්දෙනෙක්ද, එනම්,

1. ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී.සමරසේකරමැතිතුමිය

ඡන්දය ලබා දෙන ලදී. **ඒ අනුව ධීවර සංස්ථාව සඳහා කඩයක් ලබා දීමේ යෝජනාව වැඩි ඡන්ද එකොළහකින් (11කින්) සභාවේ සම්මත කර ගන්නා ලදී.**

අනතුරුව යෝජනා අංක 06:03:02 ඌරු මස් වෙළෙඳාම සඳහා පොදු වෙළඳසැලෙන් කඩ කාමරයක් ලබා ගැනීම යෝජනාව සඳහා ඡන්දය විමසූ අතර එහිදී යෝජනාවට පක්ෂව සභිකයින් දහතුන්දෙනෙක්ද, එනම්,

1. ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රි ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා
4. ගරු නාගරික මන්ති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රි ර්. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රි එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය
9. ගරු නාගරික මන්ත්‍රි එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා
10. ගරු නාගරික මන්ත්‍රිනි එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය
11. ගරු නාගරික මන්ත්‍රිනි එම්. ශාන්තිලේඛා මැතිතුමිය
12. ගරු නාගරික මන්ත්‍රි කේ. ජී. පේමදාස මැතිතුමා
13. ගරු නාගරික මන්ත්‍රි අකිල එල්ලාවළ මැතිතුමා

මෙහිදී යෝජනාවට විරුද්ධව සභිකයින් හතර දෙනෙක්ද, එනම්,

1. ගරු නාගරික මන්ත්‍රි එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රි එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී.සමරසේකරමැතිතුමිය

ඡන්දය ලබා දෙන ලදී. ඒ අනුව **උෟරු මස් වෙළෙඳාම සඳහා පොදු වෙළෙඳසැලෙන් ස්ථානයක් ලබා දීම සඳහා සභාවේ වැඩි ඡන්ද නවයකින් (09කින්) මෙම යෝජනාව සම්මත කර ගන්නා ලදී.**

06:04 **ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය**

**6:4:1** අනඳමෙත්ගම දෙවන පටුමග කපිතාන් ගුණපාල නමින් නම් කිරීම

**6:4:2** ජාතික ජල සම්පාදන මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කර ගන්නා ලද රු.110,000.00 ට ආසන්න මුදල ශෛලතලාරාම විහාරස්ථානයට සිමෙන්ති හා අනෙකුත් අමුද්‍රව්‍ය මිළදී ගැනීමට යෙදවීම.

**6:4:3** ගම්පෙරලිය වැඩසටහන යටතේ කිරිඳිගල ග්‍රාම නිළධාරි වසමේ ඉදිකරනු ලබන කානු පද්ධතිය ඇතුළත හිඳුවා ඇති ටෙලිකොම් ආයතනයේ, ඩයලොග් ආයතනයේ, විදුලි බල මණ්ඩලයේ කණු, එම කාණු පද්ධතියට අවහිරයක් නොවන සේ සිටුවීමට එම ආයතන දැනුවත් කිරීම.

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී සභාපතිතුමා කපිතාන් ගුණපාල ජීවතුන් අතර සිටී ද යන්න ගරු නාගරික මන්ත්‍රී තරංගනී සමරසේකර මැතිතුමියගෙන් විමසා සිටි අතර කපිතාන් ගුණපාල ජීවතුන් අතර සිටින බව මන්ත්‍රීතුමිය විසින් පවසා සිටියාය. එහිදී ජීවත්ව සිටින කෙනෙකුගේ නමින් මාර්ගයක් නම් කිරීම කළ නොහැකි බව චක්‍රලේඛයක් මගින් දැනුම් දී ඇති බව ප්‍රකාශ කරන ලදී.

මෙහිදී **ගරු නාගරික මන්ත්‍රීනි තරංගනී සමරසේකර මැතිතුමිය** විසින් අදහස් දක්වමින්, ජීවත්ව සිටින කෙනෙකුගේ නමින් මාර්ගයක් නම් කිරීමට නොහැකි බව තමන් නොදන්නා බවත්, එම යෝජනාව ඉල්ලා අස් කර ගන්නා බවත් පවසා සිටියාය.

ජාතික ජල සම්පාදන මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කර ගන්නා ලද රු.110,000.00 ට ආසන්න මුදල ශෛලතලාරාම විහාරස්ථානයට සිමෙන්ති හා අනෙකුත් අමුද්‍රව්‍ය මිළදී ගැනීමට යෙදවීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත්, මන්ත්‍රී ප්‍රතිපාදන රු.400,000.00 යොදා ගනිමින් ශෛලතලාරාම විහාරස්ථානයට ජලය ලබා දීම සඳහා කටයුතු කළ අතර ඒ සඳහා රු.460,000.00 ක මුදලක් වැය වී ඇති බවත්, එහි දී වැඩිපුර වැය වූ රු.60,000.00 ක මුදල සභාවෙන් ගෙවිය හැකි ද යන්නත් විමසා සිටියාය.

මෙහිදී පිළිතුරු ලබා දුන් සභාපතිතුමා, ශෛලතලාරාම පන්සලට ජලය ලබා දීමේ කර්මාන්තය පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන මගින් සිදු කළ කර්මාන්තයක් බැවින්, සභාවෙන් වැඩිපුර වියදම් වූ රු.60,000.00 ක මුදල සභාවෙන් ගෙවිය නොහැකි බව පැවසීය. එම නිසා ජාතික ජල සම්පාදන මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කර ගන්නා ලද රු.110,000.00 ක මුදලින් රු.60,000.00 මුදල අඩුකර, ඉතිරි මුදලින් ඉල්ලා ඇති පරිදි සිමෙන්ති හා අනෙකුත් අමුද්‍රව්‍ය මිළදී ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම ගම්පෙරලිය වැඩසටහන යටතේ කිරිදිගල ග්‍රාම නිළධාරි වසමේ ඉදිකරනු ලබන කාණු පද්ධතිය ඇතුලත හිඳුවා ඇති ටෙලිකොම් ආයතනයේ, ඩයලොග් ආයතනයේ හා විදුලි බල මණ්ඩලයේ කණු එම කාණු පද්ධතියට අවහිරයක් නොවන සේ සිටුවීම සඳහා එම ආයතන දැනුවත් කරන ලෙස සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිමින් ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය දීර්ඝව අදහස් දැක්වීය.
එහිදී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමන් විසින් අදාළ ආයතන ලිඛිතව දැනුවත් කරන බව පවසා සිටියේය.

**6ඃ4ඃ2ඃ යෝජනාව රුඃ60,000.00 ක මුදල අඩුකර ඉතිරි මුදල් ශෛලතලාරාම විහාරස්ථානයට සිමෙන්ති හා අනෙකුත් අමු ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහාත්, 6ඃ4ඃ3ඃ යෝජනාව සඳහා විරෝධතා නොමැති නිසාත් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:05 ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා**

**06፥05፥01** සෙලෝවත්ත පාරේ අබලන් ස්ථාන වලට තාර දමා සංවර්ධනය කිරීම

**06፥05፥02** ජනපද පාරේ අතුරු මාර්ගය අබලන් ස්ථාන වලට තාර දමා සංවර්ධනය කිරීම

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා අදහස් දක්වමින්,** සෙලෝවත්ත පාර දීර්ඝකාලයක සිට පිළිසකර කර නොමැති බැවින් එම පාර බොහෝ සෙයින් අබලන්ව ඇති බව පැවසීය. එමෙන්ම ජනපද පාරේ අතුරු මාර්ගයේ එක් කොටසක් ගම් පෙරලිය වැඩසටහන මඟින් ලබාදුන් රු.500,000.00 ක මුදල යොදා සංවර්ධනය කර ඇති බවත්, ඉතිරි කොටස තාර දමා සංවර්ධනය කර දෙන ලෙසත් ඉල්ලා සිටිමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු සභාපතිතුමන් පිළිතුරු ලබා දෙමින් මෙම **06፥05፥01** හා **06፥05፥02** යෝජනා නඩත්තු ලේඛනයට ඇතුළත් කරන බව දන්වා සිටින ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:06 ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

**06፥06፥01** බෝම්බුව පන්සලවත්ත පාර මේවන විට ඉතාමත් අබලන් තත්වයට පත්ව ඇති හෙයින් මෙම මාර්ගය අලුත්වැඩියා කිරීම.

**06፥06፥02** බෝම්බුව ආචාරිමලේ මාර්ගයේ කාණු සියල්ලම ගොඩ වී ඇති හෙයින් වැසි ජලය පාර දිගේ ගලා යාමෙන් මාර්ගය සෝදා පාලුවට ලක්ව ඇති නිසා මෙම කාණු ගොඩ දැමීම

**06፥06፥03** බෝම්බුව ප්‍රධාන මාර්ගය දෙපස කාණු පද්ධතිය මේ වෙන විට වල් බිහිවීම නිසා ගොඩ වී ඇති නිසා එම කාණු පද්ධතිය පිළිසකර කිරීම.

**06፥06፥04** අප කොට්ඨාසය තුළ ඇති සමහර නිවෙස් වල අප ජලය බට මගින් කාණු පද්ධතියට යොමු කර ඇත. මෙම අප ජලය කාණු හරහා කුඹුරු වලට හා ඇළ මාර්ගයට යොමුවන නිසා ගම්වාසීන් විවිධ රෝගබාධයන්ට ලක්වීමට අවධානම යොමු වී තිබේ. එම නිසා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ අවධානය එය වෙත යොමු කර ඊට අදාළ පියවර ගැනීම.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා** අදහස් දක්වමින්, බෝම්බුව පන්සලවත්ත පාර මේ වන විට ඉතා අබලන් තත්ත්වයට පත්ව නමුත් වසර දහයකින් පමණ පිළිසකර කර නොමැති බවත්, එම නිසා ඉතා ඉක්මනින් පිළිසකර කර දෙන ලෙසත් පැවසීය.

බෝම්බුව ආචාරිමලේ මාර්ගයේ කාණු සියල්ලම ගොඩ වී ඇති හෙයින් වැසි ජලය පාර දිගේ ගලා යාමෙන් මාර්ගය සෝදා පාලුවට ලක්ව ඇති බවත්, එම මාර්ගය ඉතා ඉක්මනින් පිලිසකර දෙන ලෙසත් පවසා සිටියේය.

බෝම්බුව ප්‍රධාන මාර්ගය දෙපස කාණු පද්ධතිය මේ වන විට වල් බිහිවීම නිසා ගොඩ වී ඇති අතර මෙම මාර්ගය පළාත් සංවර්ධන අධිකාරියට අයත් මාර්ගයක් වේ. නමුත් එම ආයතනය මඟින් මෙම මාර්ගයේ අලුත්වැඩියා කටයුතු සිදු නොකරන බැවින් නගර සභාවේ සේවකයින් යොදා ගනිමින් හෝ මෙම මාර්ගය පිලිසකර කර දෙන ලෙස ඉල්ලා සිටියේය.

බළන්ගොඩ කොට්ඨාසය තුළ නිවාස ඉතා ආසන්නව පිහිටා ඇති නිසා එම නිවාස වලින් පිටවන අප ජලය බට මඟින් කානු පද්ධතියට යොමු කර ඇත. එබැවින් ෆිල්ටර් ක්‍රමයක් මඟින් හෝ එම අප ජලය පිරිසිදු කර දෙන ලෙසත් ඉල්ලා සිටිමින් මන්ත්‍රීතුමාගේ අදහස් දැක්වීම අවසන් කලේය.

මෙහිදී පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් බෝම්බුව ප්‍රධාන මාර්ගය දෙපස කානු පද්ධතිය පළාත් මාර්ගයක් බැවින් එම මාර්ගය සඳහා ඉදිරියේදී සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමටත්, අනෙකුත් යෝජනා සභාවේ නඩත්තු මඟින් සිදු කරන බවත් පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:07 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

06:07:01 බළන්ගොඩ ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුව කඩිනමින් පැවැත්වීමේ අවශ්‍යතාවය පැහැදිලි කර, අතිගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා, බළන්ගොඩ ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු සභාපති, අමාත්‍ය තලතා අතුකෝරළ මැතිනියට සහ බළන්ගොඩ ප්‍රාදේශිය ලේකම්තුමාට දන්වා සිටීම.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා** අදහස් දක්වමින් බළන්ගොඩ ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුව යනු ප්‍රදේශයේ ජනතාවගේ දුවෙන ප්‍රශ්න කඩිනමින් විසඳීම සඳහා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ දී, එතුමා විසින් ඇති කරන ලද සංකල්පයක් වන අතර එතුමාගේ කාලයේදී මෙම කමිටුව මාස තුනකට වරක් පැවති බව පැවසීය. නමුත් 2015-01-08 දිනෙන් පසු අවස්ථා තුනක දී පමණක්

මෙම කමිටුව පවත්වා ඇති බවත්, 2018-06-14 දින අවසන් වරට පවත්වා ඇති බවත් පවසා සිටින ලදී.

වැඩි දුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා බළන්ගොඩ ප්‍රාදේශිය ලේකම්තුමා අවස්ථා කිහිපයක දී සම්බන්ධීකරණ කමිටු සභාපති, අමාත්‍ය තලතා අතුකෝරළ මැතිනියගෙන් මේ සම්බන්ධව ඉල්ලීම් කර ඇතත් මේ වන තෙක් එතුමියගෙන් දිනයක් නොලැබීම නිසා මෙම කමිටුව පැවැත්වීමට නොහැකි වී ඇති බැවින් එතුමිය මේ පිළිබඳව දැනුවත් කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

එහිදී පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා පැවසූයේ ආර්.ප්‍රේමදාස ජනාධිපතිතුමන්ගේ කාලයේදී ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාල ඇති කර මෙම කමිටු ස්ථාපිත කල බවත්, අමාත්‍ය තලතා අතුකෝරළ මැතිනිය මේ පිළිබඳව දැනුවත් කරන බවත් පවසා සිටින ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2019.04.29 දින හා 2019.05.21 දින පැවති මුදල් කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

**08. ආදායම් වියදම් වාර්තා සලකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 13,055,122.44 |
| වෙනත් ලැබීම් | 3,003,676.78 |
| මුලු ලැබීම් | 16,058,799.22 |
| පුනරාවර්තන වියදම් | 8,427,881.60 |
| වෙනත් වියදම් | 4,241,616.72 |
| මුලු වියදම් | 12,669,498.32 |

**ඉන්ධන වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.**

2019 -05-01 සිට 2019-05-31 දක්වා

| **වාහන අංකය** | **මුළු එකතුව** |
|---|---|
| 226-7521 | 17,784.00 |
| 227-5020 | 30,196.00 |
| 56-1906 | 43,863.00 |

| | |
|---|---|
| BC-0005 | 41,600.00 |
| DPP 0006 | 3,930.00 |
| RD-8000 | 5,200.00 |
| GC 0001 | 7,640.00 |
| GK-1483 | 13,104.00 |
| GK-6227 | 33,352.00 |
| HF - 8558 | 3,640.00 |
| JD-4684 | 2,700.00 |
| LL-2110 | 14,150.00 |
| LL-7688 | 5,200.00 |
| MIXB 0011 | 1,350.00 |
| ND-5124 | 16,432.00 |
| OS-0006 | 1,350.00 |
| PF-4006 | 12,636.00 |
| PF-4006 | 13,608.00 |
| QL-2901 | 4,320.00 |
| RB-4786 | 26,795.00 |
| RC-1107 | 23,980.00 |
| RC-1118 | 32,276.00 |
| RC-8183 | 31,995.00 |
| RD-8240 | 27,415.00 |
| RD-8240 | 1,076.00 |
| RD-8240 | 700.00 |
| RE-2600 | 5,200.00 |
| UQ - 1933 | 4,050.00 |
| ZA - 0228 | 4,160.00 |
| ZA - 9835 | 19,136.00 |
| YG-0758 | 2,025.00 |
| ZA - 5039 | 48,880.00 |
| **එකතුව** | **499,743.00** |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය**

**09. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.**

**<u>ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා තම අදහස් ඉදිරිපත් කරමින් පවසා සිටියේ මෙවර වෙසක් උත්සවය වෙනුවෙන් නගරයේ සැරසිලි කිරීමට ඉදිරිපත් වූ බළන්ගොඩ තරුණ කැළ, වෙළෙඳ සංගමය, බළන්ගොඩ නගර සභාවේ සභාපතිතුමා ඇතුලු සියලු

දෙනාට ස්තුතිය පුද කර සිටින බවයි. නමුත් ඇතැමුන් මෙම වෙසක් උත්සවය සැමරුවේ ලෝකයේ පළමු වෙසක් උත්සවය ලෙස බවත්, ඇතැම් ස්වාමීන් වහන්සේලාට මෙන්ම දේශපාලාඥයන්ට ද විවිධ චෝදනා එල්ල කර බවත්, එසේ කිරීම වැරදි සහගත බවත්, මෙය ජාතිවාදයක් කර ගැනීම සුදුසු නොවන බවත් පෙන්වා දෙන ලදී. මෙම වසරේ මෙන්ම ඉදිරියට ද නගරයේ වෙසක් සැරසිලි සිදුකළ යුතු බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රි අකිල එල්ලාවළ මැතිතුමා වසර ගණනාවක සිට නගරයේ වෙසක් සැරසිලි වෙළෙඳ සංගමය විසින් සිදු කළ බවත්, ඉදිරියටත් ඔවුන්ගේ සහයෝගය ලබා ගන්නා ලෙසත් පැවසීය.

**<u>ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් ඕලුංගංතොට 'තේ ශක්ති' තේ කම්හල පිටුපස ඇල්ෆාවත්ත ගමෙහි නිවාස 10 කට ජලය නොමැති බැවින් එම නිවාස වලට ජලය ලබා දීම සඳහා සභාපතිතුමාගෙන් ජල බවුසර් දෙකක් ඉල්ලූ අවස්ථාවේදී එය ඉතා ඉක්මනින් ලබා දීම පිළිබඳ එතුමාගේ ගෞරවනීය ස්තුතිය සභාපතිතුමා වෙත පුද කරන ලදී. එමෙන්ම එම නිවාස සඳහා ජලය ලබා ගැනීමට ජල සම්පාදන මණ්ඩලය මඟින් ඇස්තමේන්තු කර ඇති මුදල රු.100,000.00 ක් වන අතර හැකියාවක් තිබේනම් එම මුදල සභාවෙන් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

එහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමන් එම මුදල සභාවෙන් ලබා දිය නොහැකි නිසා ඉදිරියේදී ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හරහා හෝ එම කාර්යය ඉටු කර ගන්නා ලෙස දන්වා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රි කේ. ජී. පේමදාස මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රි කේ. ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින්, බළන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ වසම් 53 න් 51 ක වැඩිහිටි සංගම් පවතින අතර නගරය අවට ඇති සමිති සියල්ලම මේ වන විට ලියාපදිංචි කර ඇති බව පැවසීය. මෙම සමිති සියල්ලම ග්‍රාම නිළධාරි, ප්‍රාදේශිය ලේකම්, දිස්ත්‍රික් ලේකම් හා සුභ සාධන අමාත්‍යාංශය යටතේ අධීක්ෂණය වන බැවින් කොන්ත්‍රාත් ලබා ගැනීමේ ගැටලුවක් නොමැති බවත්, මෙමඟින් ලැබෙන මුදල් වැඩිහිටියන්ගේ සුභසාධනය වෙනුවෙන් යොදවන බවත් වැඩිදුරටත් පැවසීය.

**<u>ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා</u>**

අපේ රට කාලයෙන් කාලයට ඉංග්‍රීසින්, ලන්දේසින්, පෘතුග්‍රීසින් හා දමිළ රජවරුන් පාලනය කළ අතර එම කාල වකවානු තුළ සිංහල ජනතාවගේ එකමුතුව නොමැති බැවින් යටත් වැසියන් වශයෙන් ජීවත් වීමට සිදු වූ බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා පැවසීය.

අප්‍රේල් 21 පාස්කු ඉරු දින අයි එස් ත්‍රස්තවාදීන් විසින් එල්ල කළ ප්‍රහාරය හෙළා දකින අතරම අපි සියලු දෙනා කුමන ජාතියක් ලෙස ජීවත් වුවද, ජාතිවාදීන් නොවී ශ්‍රී ලාංකිකයන් ලෙස සංහිදියාව යථාර්තයක් කර ගනිමින් ජීවත් විය යුතු බව පවසන ලදී. මුස්ලිම් ජාතිකයන් ලංකාවට වෙළෙඳාමට පැමිණීමෙන් අනතුරුව සිංහල කාන්තාවන් විවාහ කර ගත් අතර එම නිසා සිංහල මුස්ලිම් සියලු දෙනා නෑදෑයන් සේ ජීවත් විය යුතු බව පැවසීය.

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා 2004 වර්ෂයේ අගමැතිව සිටිය දී ගම් 4000 ක් සංවර්ධනය කිරීමේ අරමුණින් ගම නැගුම වැඩසටහන ක්‍රියාත්මක කල අතර, එහි දී එක් ගමකට රුපියල් 1,000,000.00 බැගින් වෙන් කර මහ මාර්ග ආදිය සංවර්ධනය කළ බව් පැවසීය. 2005 වර්ෂයේ ජනාධිපති බවට පත්වීමෙන් අනතුරුව අවුරුදු 30 ක යුද්ධය නිමා කොට සෑම ජන කොටසකටම නිදහසේ ජීවත් වීමේ අයිතිය ලබා දෙමින් අප රටට අවශ්‍යව තිබූ ආදායම් මාර්ග වශයෙන් සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා අධිවේගී මාර්ග, ගුවන් පාලම්, නව වරායක්, නව ගුවන් තොටුපලක්, සම්මන්ත්‍රණ ශාලාවක්, හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණයක් ඉදිකර නොදියුණු හම්බන්තොට සංවර්ධනය කළ බව වැඩිදුරටත් පවසන ලදී. එමෙන්ම බළන්ගොඩ නගරයට අවශ්‍යව තිබූ පානීය ජල ව්‍යාපෘතියට මුල්ගල තබමින් 2013 අයවැයෙන් මුදල් වෙන් කර, වැඩ ආරම්භ කළ බව පැවසූ අතර, සභාපතිතුමාට ගමන් බිමන් යාමට අවශ්‍ය ඩබල් කැබ් රථයක්ද, මන්ත්‍රීවරුන් සඳහා රු.50,000.00 ක මුදලක් අයකර මෝටර් බයිසිකලයක් ද, සභා කර්මාන්ත සිදු කිරීමට අවශ්‍ය ෆෝටෝන් වර්ගයේ ජේසීබී යන්ත්‍රයක්, මෝටර් ග්‍රේඩරයක්, ලෙලන යන්ත්‍රයක්, කෘෂ කැබ් රථයක් නොමිලේ ලබා දුන් බවත්, ක්ෂේත්‍ර නිළධාරීන් සඳහා මොටර් බයිසිකලයක් ලබා දුන් බවත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේදී පොහොර මිටියක් රුපියල් 350.00 ක මුදලට ලබා දීම, කෘෂිකර්මාන්තයට අවශ්‍ය කෘෂි රසායනික ද්‍රව්‍ය මිළ අඩුකර ලබා දීම, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් නොමිලේ ගම්මිරිස් පැළ, පළතුරු පැළ හා ගෙවතු වගාවට අවශ්‍ය වන බණ්ඩක්කා, මෑ, බෝංචි වැනි බීජ වර්ග සමඟ පොහොර පාර්සලයක් ලබා දීම තුළින් පළාතේ ජීවත් වන ජනතාවගේ ජීවනෝපාය දියුණු කර දේශිය නිෂ්පාදන වලට, කෘෂි බෝග වලට වෙළෙඳපලේ ඉහළ මිළක් ලබා දීම සිදු කල බව පවසන ලදී.

## ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින්, මෙවර වෙසක් පොහොය සඳහා නගරය සැරසීමේදී ඇතැමුන් වෙළෙඳ සංගමයට ඇඟිල්ල දිගු කළ අතර නමුත් වසර 12ක් පුරාවට නගරය කොඩි දමා සැරසිලි සිදුකරේ තම සංගමය බැවින් එසේ

චෝදනා කිරීම වැරදි බව පවසා සිටියේය. එමෙන්ම වෙළෙඳ සංගමය යනු බෞද්ධ සංගමයක් නොවන අතර තම සංගමය මෙතෙක් කල් මෙම කාර්යය ඉටු කළේ ප්‍රදේශයේ බෞද්ධ සංගමයක් නොමැති බැවින් බව ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ සභාපතිතුමා සැරසිලි කිසිවක් නොතිබූ අවධියේ පටන් මෙතෙක් කල් මෙම කාර්යය ඉටු කළ වෙළෙඳ සංගමයට නගරයේ සියලු දෙනා වෙනුවෙන් තමන් ස්තුතිවන්ත වන බව පවසා සිටියේය.

වැඩිදුරටත් අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රීතුමා, ක්‍රීඩාංගණය සඳහා අඩුපාඩුවක්ව පවතින පුටු 25 ක් ලබා දෙන ලෙසත්, උත්සවයක් පවතින අවස්ථාවලදී හැර අනෙකුත් අවස්ථාවලදී එම පුටු සියල්ල කාර්යාලයෙන් ගෙනවිත් තැබීම සුදුසු බවත් බවසා සිටියේය.. එමෙන්ම දේශබන්දු මහතාගේ නිවසට යන මාර්ගය හා කොටු ගොඩැල්ල මාර්ගය පළමු පටුමග, ජයන්ති ස්ටෝර්ස් අයිතිකරුගේ නිවසට යන මාර්ගය, කොටු ගොඩැල්ල මාර්ගය දෙවන පටුමග සංවර්ධනය කර දෙන ලෙසත් පැවසීය.

**<u>ගරු නාගරික මන්ත්‍රිනී චන්ද්‍රලතා මැතිතුමිය</u>**

ගරු නාගරික මන්ත්‍රිනී චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින්, මේ දිනවල මදුරුවන් බෝ වීමේ ප්‍රවණතාවයක් පවතින අතර, මදුරුවන් බෝ වීම වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ වගා නොකරන ලද වල්බිහි වී ඇති මුඩු ඉඩම්වල බවත්, එම නිසා එම ඉඩම් හිමියන් ගෙන්වා දැනුවත් කරන ලෙසත් ඉල්ලා සිටියාය.
එමෙන්ම සුදර්ශනගම මාර්ගය මේ වන විට ශුද්ධ පවිත්‍ර කර ඇති අතර, ඒ පිළිබඳව සභාපතිතුමාට ස්තුතිවන්තවන්ත වෙමින් එහි අතුරු මාර්ගයේ කොටසක් ශුද්ධ පවිත්‍ර කර නඩත්තු කටයුතු සිදු කර දෙන ලෙස වැඩිදුරටත් ඉල්ලා සිටියාය.

**<u>ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා</u>**

පුබුදමු ගම්මැද්ද වැඩසටහන බුලත්ගම කොට්ඨාසයට රැගෙන ඒම සම්බන්ධයෙන් සභාපතිතුමාට ස්තුතිවන්ත වන අතර, කරව්කැටිය මාර්ගය අලුත්වැඩියා කිරීම සඳහා මුදල් ගෙවීම සම්බන්ධයෙන් තමන් සභාපතිතුමාට චෝදනාවක් නොකළ බව පැවසීය. නමුත් සභාපතිතුමාට මුදල් වියදම් කිරීමේ බලය රු.500,000.00 දක්වා වැඩි කිරීම සම්බන්ධයෙන් තමා අදටත් විරුද්ධ වන බව පවසා සිටියේය.

**<u>ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින්, බළන්ගොඩ ප්‍රදේශයේ ජීවත් වන බෞද්ධ ජනතාව වශයෙන් තමා ද සම්බන්ධ වී සිටින සෙත්සිරි හා මෙත්සිසිල පදනම මඟින් සෑම පොහෝ දිනකම කොඩි වැල් හා බල්බ් වැල් දමා නගරය අලංකාර

කරමින් නිහඬ සේවයක් කළ නමුත් මෙවර වෙසක් පෝයට මෙම පදනම් දෙක එයින් ඉවත්ව සිටි බව පැවසීය.

නගරයේ ජනතාවගේ පරිභෝජනයට අවශ්‍ය ආහාර සැපයීම සභාවේ වගකීම වුවත්, රටේ පවතින තත්ත්වය සලකා බලා මෙම අවස්ථාවේ දී ඌරු මස් කඩය දැමීම සුදුසු නොවන බැවින් මෙම අවස්ථාවේ "ඇවිලෙන ගින්නට පිදුරු දැමීම" වෙනුවට කාලෝචිතව මේ සම්බන්ධව කටයුතු කළ යුතු බව පවසා සිටියේය.
වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීතුමා, බළන්ගොඩ විද්‍යාලෝක විද්‍යාලය ඉදිරිපිට ඇති මුඩු ඉඩමට මිනිසුන් කුණු කසළ ගෙනැවිත් දමන අතර එම ඉඩම මේ වන විට කොම්පෝස්ට් එකක් වී පවතින බව බවසා සිටියේය. එබැවින් එම ස්ථානයේ ඩෙංගු මදුරුවන් බෝ වීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබෙන බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා</u>**

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා එක්සත් ජාතික පක්ෂ රජයක් පවතින කාලයේ දී ඌරු මස් කඩය පිළිබඳ යෝජනාව සම්මත වීම පිළිබඳ තමා කණගාටුවට පත්වන අතර මෙම යෝජනාවට විපක්ෂව ඡන්දය ලබා දුන් මන්ත්‍රීවරුන් හතරදෙනාට තමන්ගේ ස්තුතිය පුද කරන බව පැවසීය.

**<u>ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය</u>**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය තම අදහස් ඉදිරිපත් කරමින්
තමන් මෙම යෝජනා ඉදිරිපත් කළේ කිහිපදෙනෙක් තමන්ගෙන් මේ පිළිබඳව විමසා සිටීම නිසා බවත්, මේ පිළිබඳව තමන් සමග මන්ත්‍රීවරුන් යම් අමනාපයක් ඇති වී තබේ නම් එය ඉවත් කර ගන්නා ලෙසත් ඉල්ලා සිටියාය.

**<u>ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින්, අද සභාවේ විශේෂ යෝජනා වශයෙන් සාකච්ඡාවට බඳුන් වූ ධීවර සංස්ථාවේ මාළු විකිණීම සඳහා කඩ කාමරයක් ලබා දීම හා ඌරු මස් වෙළෙඳාම සඳහා කඩ කාමරයක් ලබා දීම පිළිබඳ යෝජනා දෙකම තමන් මීට පෙර සභාවන් වලදී ගෙන ආ යෝජනා බව පැවසීය. එමෙන්ම තමා එම කාලයේදී මෙම යෝජනා ගෙන එන විට ජාතිවාදයක් නොතිබුන අතර සුනේත්‍රා මන්ත්‍රීතුමිය මෙම සභාවට එම යෝජනාව රැගෙන ආවේ ජාතිවාදයක් ගැන නොසිතා බවත්, සුනේත්‍රා මන්ත්‍රීතුමිය මේ අවස්ථාවේදී අසරණ විය යුතු නැති බවත් පැවසීය. හරක් මස් කඩය තිබෙන ස්ථානයේම ඌරු මස් කඩය දැමීමේ අවශ්‍යතාවයක්

නොමැති අතර, අතුරු ව්‍යවස්ථාවක් සකස් කර ඒ සඳහා සුදුසු ස්ථානයක් ලබා දීම සුදුසු බව පවසා සිටියේය.

අද රටේ පවතින තත්ත්වය නිසා මුස්ලිම් ජනතාව විශාල අර්බුදයකට මුහුණ පා ඇති අතරම රටක දුර්වල පාලකයෙක් පැමිණි සෑම අවස්ථාවකදීම සතුරු බලවේග බොහෝ ක්‍රියාත්මක වීම මෙන්ම අද රට තුළ මුස්ලිම් ජනතාවට වෙනත් නීතියක් ක්‍රියාත්මක වීම දකින්නට ලැබෙන බව පැවසීය. මේ සඳහා උදාහරණ ලෙස සිංහල ජනතාවට විවාහ වීමේ අවම වයස අවුරුදු 18 වන නමුත් මුස්ලිම් ජනතාවගේ විවාහ වීමේ වයස අවු 12 වීම දක්වන ලදී. එම නිසා මෙම ප්‍රශ්නය පිළිබඳ සම්මුතියකට පැමිණීම සඳහා මුස්ලිම් මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටි අතර රට තුළ ජාතිවාදයේ ගිනි දැල් ඇවිලී යාමෙන් අපේ රටට හා අනාගත පරපුරට හානියක් සිදු වීමට ඉඩ නොතබන ලෙස පවසමින් මන්ත්‍රීතුමාගේ අදහස් දැක්වීම අවසන් කළේය.

<u>ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා</u>

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින්, පුබුදමු ගම්මැද්ද වැඩසටහන තම මාස තුනකින් පමණ කිරිඳගල කොට්ඨාසයට ගෙන එන බව දැනගන්නට ලැබුණු අතර ඒ සඳහා අවශ්‍ය යෝජනා සභාවට ලබා දුන් පසුව තවත් යෝජනා කිහිපයක් තමන් වෙත ලැබුනු බව පැවසිය. එනම්,

- ශෛලතලාරාම මාර්ගය පුළුල් කිරීම.
- අනඳමෙත්ලම මාර්ගය අලුත්වැඩියා කිරීමේදී මාර්ගයට දමා ඇති ගැටි වලින් අනවශය ගැටි ඉවත් කිරීම.
- ඕලුගංතොට ගංගාරාම පන්සලට ඉදිරිපිට වලවේ ගඟට බසින පඩිපෙල ශුද්ධ කර දීම.
- කිරිඳිගල මැද පාරේ අවසාන කොටස ප්‍රතිසංස්කරණය කර දීම.

එම යෝජනා වන අතර එම නඩත්තු කටයුතු ඉක්මනින් සිදු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

එමෙන්ම නැගෙනහිර ආණ්ඩුකාරවර හිස්බුල්ලා මහතා කළ "මුස්ලිම් ජනතාව දැන් බය වෙලා ඉන්නේ. ඔබලා බය වෙන්න එපා. අපි ලංකාවේ සුළු ජාතිය වුණාට ලෝකයේ මහ ජාතිය. බය නොවී පාරට බහින්න" යන ප්‍රකාශය හෙළා දකින අතර ඇති වී තිබෙන තත්ත්වය සමථයකට පත්වන අවස්ථාවේ දී එවන් ප්‍රකාශ සිදු කිරීම වැරදි සහගත බව පවසන ලදී. එමෙන්ම අනවශ්‍ය ප්‍රශ්න ඇති නොකර සාමයෙන් සතුටින් ජීවත් වන ලෙස සියලු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමින් අදහස් දැක්වීම අවසන් කළේය.

## 10. අවසානය

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, සිංහල මුස්ලිම් දෙමළ සියලු ජාතීන් එකට ජීවත් විය යුතු අතර අප සියලු දෙනාගේ මානසිකත්වය සියලු ආගම් හා සියලු ජාතීන්ට ගරු කරන තත්වයට හැඩ ගැසී තිබිය යුතු බව පවසා සිටියේය. අද දින සභාවේදී කා

සමඟ හෝ වෛරයක් ඇතිකර ගැනීම, කාට හෝ අඩු සැලකිල්ලක් දැක්වීම සිදු නොවුන බවත්, වෙනත් මිනිස්සුන්ගේ අයිතිවාසිකම් කප්පාදු කර අපිට වැඩිපුර දෙයක් ලබාගෙන නොමැති බවත් පවසන ලදී.

එමෙන්ම අපේ රටේ සිංහල බෞද්ධ ජනතාව මුස්ලිම් ජනතාව සමඟ සහජීවනයෙන් හා පරිත්‍යාගශීලීව කටයුතු කරන අතර එම සහෝදරත්වය පලුදු වී නොමැති බව තවදුරටත් පවසා සිටියේය.

අපි සභාවක් වශයෙන් සැම විටම කණ්ඩායමක් ලෙස බුද්ධිමත්ව හා පොදුවේ සිතිය යුතු අතර, අද ඌරු මස් කඩයක් දැමීම පිළිබඳ යෝජනාව සභාවට ගෙන ඒම හා සභාවේ සම්මත වීම පිළිබඳ අයහපත් සිතුවිලි ඇති කර නොගන්නා ලෙස පැවසීය. එමෙන්ම මේ පිළිබඳව වැරදි අවබෝධ හා අර්ථකථන සමාජගත නොකරන ලෙසත්, මුස්ලිම් ජනතාව වෙනුවෙන් අනිත් ජාතින් ලබා දී ඇති වැඩිපුර දේ ගැන හිතන ලෙසත් ඉල්ලා සිටියේය.

අප්‍රේල් 21 වන පාස්කු ඉරු දින ඇති වූ ප්‍රහාරය පිළිබඳ මේ වන විට කථා කරන්නේ අති උතුම් අගරදගුරු මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන් පමණක් වන අතර අනෙකුත් සියලු දෙනා මෙම ප්‍රශ්නය අවස්ථාවාදී ජාති වාදී ආගම්වාදී දේශපාලන වාදී ප්‍රශ්නයක් බවට පත් කර ගෙන ඇති බව පැවසූ ගරු සභාපතිතුමා එම සිදු වීමට මුල් වූ මූලික ප්‍රශ්නය මේ වන විට සියලු දෙනා අමතක කරමින් සිදුවූ සිදුවීමට මේ වන විට සාධාරණ විසඳුමක් ලබා දී නොමැති බව පැවසීය.

සියලු දේ දේශපාලනීකරණය වී ඇති අතර අපි රටක්, ජාතියක් ලෙස තව තවත් පසුපසට යමින් සිටින බව පැවසීය. එමෙන්ම මුස්ලිම් කඩ වර්ජනය කිරීමෙන් හා බෙදීම් ඇති කර ගැනීමෙන් සිදුවන්නේ රට තව තවත් අගාධයට යාම බැවින් සමාජය තුළ යහජීවනය පතුරා සියලු දෙනා එක්ව සමඟියෙන් ජීවත් විය යුතු බව පවසමින් සභාවට සම්බන්ධ වූ සියලු දෙනාට ස්තුතිය පුද කල ගරු සභාපතිතුමා සභාවේ වැඩ කටයුතු ප.ව.03.00 ට පමණ අවසන් කළේය.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බලංගොඩ නගර සභාව.